**රජයේ නිවේදනයයි**

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

**2 වැනි වගන්තිය යටතේ නියමය**

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2018 නොවැම්බර් මස ....02...... වැනි දින සිට මාස 3 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2018.06.14 දිනැති අංක 2075/31 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 0713.31.29 යටතේ වන උඳු සහ 2018.05.09 දිනැති අංක 2070/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංයෝජිත වර්ගීකරණ අංක 0713.40.11,0713.40.12, 0713.40.21 සහ 0713.40.22 යටතේ වන පරිප්පු සහ 2018.09.07 දිනැති අංක 2087/76 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංයෝජිත වර්ගීකරණ අංක 0713.20.10,0713.20.20 යටතේ වන කොණ්ඩ කඩල සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2018 නොවැම්බර් මස ....02........ වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ
මුදල් හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය

2018 නොවැම්බර් මස ....01...... දින,
කොළඹ 01,
මුදල් හා ආර්ථික කටයුතු පිලිබඳ අමාත්‍යාංශයේදීය.

## උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 01 | 07.13 | 0713.20.10 | සම්පූර්ණ - කොණ්ඩ කඩල (ගාර්බන්සෝස්) | කි. ග්‍රෑමයට රු. 2.00 |
| | | 0713.20.20 | පියළි කළ - කොණ්ඩ කඩල (ගාර්බන්සෝස්) | කි. ග්‍රෑමයට රු. 5.00 |
| 02 | | 0713.31.29 | අනෙකුත් - උඳු | කි.ග්‍රෑමයට රු. 125.00 |
| 03 | | 0713.40.11 | සම්පූර්ණ - මයිසූර් පරිප්පු(රතු පරිප්පු) | කි. ග්‍රෑමයට රු. 2.00 |
| | | 0713.40.12 | පියළිකළ- මයිසූර් පරිප්පු(රතු පරිප්පු) | කි. ග්‍රෑමයට රු. 7.00 |
| | | 0713.40.21 | සම්පූර්ණ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට රු. 2.00 |
| | | 0713.40.22 | පියළිකළ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට රු. 7.00 |
| | | | | |
| 04 | 17.01 | | ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනික පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | එකතු කරන ලද රස කාරක හෝ වර්ණ අඩංගු නොවූ ශුද්ධ නොකළ සීනි | |
| | | 1701.12 | බීට් සීනි | කි.ග්‍රෑමයට රු. 35.00 |
| | | 1701.13 | උක් සීනි | කි.ග්‍රෑමයට රු. 35.00 |
| | | 1701.14 | අනෙකුත් උක් සීනි | කි.ග්‍රෑමයට රු. 35.00 |
| | | | අනෙකුත් | |
| | | 1701.91 | එකතු කරන ලද රස කාරක හෝ වර්ණක අඩංගු | |
| | | 1701.91.10 | සීනි | කි.ග්‍රෑමයට රු. 35.00 |
| | | 1701.91.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 35.00 |
| | | 1701.99 | අනෙකුත් | |
| | | 1701.99.10 | සුදු ස්ඵටිකකෘත උක් සීනි | කි.ග්‍රෑමයට රු. 32.00 |
| | | 1701.99.20 | සුදු ස්ඵටිකකෘත බීට් සීනි | කි.ග්‍රෑමයට රු. 32.00 |
| | | 1701.99.30 | අනෙකුත් සීනි | කි.ග්‍රෑමයට රු. 35.00 |
| | | 1701.99.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 35.00 |